තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව
தகவல் தொழிநுட்ப முகாமைத்துவத் திணைக்களம்
DEPARTMENT OF INFORMATION TECHNOLOGY MANAGEMENT
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහ ලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம் கொழும்பு 01, இலங்கை
The Secretariat, Colombo 01, Sri Lanka.

දුරකථනය / தொலைபேசி / Telephone: +94 11 2484582
ෆැක්ස් / தொலைநகல் / Fax: +94 11 2421219
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail: dgitm@itmd.treasury.gov.lk


මගේ අංකය / எனது இல.: ITM/01/01/02/002
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2024.08. 06

සියලුම අමාත්‍යාංශ ලේකම්වරු
පළාත් ප්‍රධාන ලේකම්වරු
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරු

**<u>අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) තනතුරු පුරප්පාඩුව</u>**
**<u>අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය 2024.08.14 දක්වා දීර්ඝ කිරීම</u>**

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී ඇති අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) තනතුර සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවීම සඳහා 2024.07.22 දින මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ (www.treasury.gov.lk) හා 2024.07.25 දින රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ (www.pubad.gov.lk) පළ කරන ලදි. එම අයදුම්පත් කැඳවීම අනුව අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය 2024.08.07 දිනෙන් අවසන් වීමට නියමිතය. නමුත් අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය **2024.08.14** දින දක්වා දීර්ඝ කරනු ලැබේ.

02. ඒ අනුව, සුදුසුකම් සම්පූර්ණ කර ඇති ඔබ ආයතනයේ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ නිලධාරීන් ඉහත තනතුරට අයදුම් කිරීමට අපේක්ෂා කරන්නනේ නම්, අදාළ අයදුම්පත්‍රය සම්පූර්ණ කර ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව **<u>dgitm@itmd.treasury.gov.lk</u>** යන විද්‍යුත් ලිපිනයට හෝ **අධ්‍යක්ෂ ජනරාල්, තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව, මහලේකම් කාර්යාලය, කොළඹ 01** යන ලිපිනයට නියමිත දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලෙස දන්වන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

03. මේ සම්බන්ධයෙන් මීට පෙර ඔබ විසින් දක්වන ලද සහයෝගයට අතිශයින් කෘතඥ වෙමි.

*රවීන්ද්‍ර පත්මප්‍රිය*
අධ්‍යක්ෂ ජනරාල්